SLGURU.LK

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

**Provincial Department of Education - NWP**

**08 S I**

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

**Second Term Test - Grade 12 - 2020**

විභාග අංකය .............................

# කෘෂි විද්‍යාව I

කාලය පැය දෙකයි

උපදෙස්

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- උත්තර පත්‍රයේ නියමිත ස්ථානයේ ඔබේ විභාග අංකය ලියන්න.
- 1 සිට 50 තෙක් එක් එක් ප්‍රශ්නයට (1), (2), (3), (4), (5) යන පිළිතුරුවලින් නිවැරදි පිළිතුර හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරාගෙන එය උත්තර පත්‍රයේ පසුපස දැක්වෙන උපදෙස් පරිදි කතිරයක් (X) යොදා දක්වන්න.

01. ගොවිජනසේවා දෙපාර්ථමේන්තුව මගින් ඉටු නොකෙරෙන කාර්යයක් වන්නේ,
   1. කෘෂි යෙදවුම් හා සේවාවන් ගොවීන්ට ලබාදීම
   2. ගොවිජන බැංකු හරහා කෘෂි ණය ලබාදිම
   3. බෝග සඳහා සුදුසු කලාප හඳුනාගෙන බෝග කලාපියකරණය සිදු කිරීම
   4. සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණ සිදු කිරීම
   5. කෘෂිකාර්මික ඉඩම් නාම ලේඛන පවත්වා ගැනිම හා අක්කර බදු අය කිරීම

02. හරිත විප්ලවය නිසා ඇතිවු යහපත් ප්‍රතිඵලයකි.
   1. ඒකක භූමියක අස්වැන්න වැඩිවීම
   2. බෝග ශාකවල ස්වභාවික ප්‍රතිරෝධීතාව අඩුවීම
   3. පළිබෝධ හානි අඩුවීම
   4. ජෛව විවිධත්වය වැඩි දියුණුවීම
   5. උසස් අස්වනු ලබාදෙන බෝග ප්‍රභේදවල හිඟතාව

03. දළ දේශීය නිෂ්පාදනය ගනනය කිරිමේදී කෘෂි කර්මාන්තයට අයත් ප්‍රධාන ක්ෂේත්‍රයක් නොවන්නේ
   1. බෝග වගාව
   2. සත්ව පාලනය
   3. ධීවර හා ජලජ සම්පත්
   4. කැපු මල් වගාව
   5. වන වගාව

04. අතීත ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික සශ්‍රීකත්වයට දේශීය තාක්ෂණය ඉවහල්වූ ආකාරය පිළිබිඹු කරන සාක්ෂියක් නොවන්නේ,
   1. ඒ ඒ ප්‍රදේශයට සුදුසු බෝග තේරීම.
   2. පරිසරය සමග බද්ධ වූ කෘෂිකාර්මික පිළිවෙත් අනුගමනය කිරීම.
   3. කාල හෝරා අනුව වගා කිරීම.
   4. වාරි කර්මාන්තය සඳහා රාජ්‍ය භාණ්ඩාගාරයේ අනුග්‍රහය ලබාදිම.
   5. ඒ ඒ ප්‍රදේශ අනුව බිම් සැකසිමේ උපකරණවල විශේෂීකරණයක් දක්නට ලැබිම.

05. කුරුඳු පර්යේෂණ ආයතනය පිහිටුවා ඇත්තේ,
   1. කඹුරුපිටිය
   2. ගන්නෝරුව
   3. රත්නපුර
   4. මාතලේ
   5. උඩවලව

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

06. කෘෂි සංවර්ධනයට වැදගත්වන ආයතන වලින් ඉටුවන සේවාවන් සම්බන්ධ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.

A කෘෂිකාර්මික පර්යේෂණ මෙහෙයවීම හා බෝග කලාපියකරණය කෘෂිකර්ම දෙපාර්ථමේන්තුව මගින් සිදු කරයි

B බෝග වගා සැලසුම්කරණය , සහතික කළ බීජ නිෂ්පාදනය ගොවිජනසේවා දෙපාර්ථමේන්තුව මගින් සිදු කරයි

C සත්ව රෝග මර්ධනය හා නිවාරණය සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය දෙපාර්ථමේන්තුව මගින් සිදු කරයි

මෙම ප්‍රකාශවලින් නිවැරදි වන්නේ,

1. A පමණි  2. B පමණි  3. C පමණි
4. A හා B පමණි  5. A හා Cපමණි

07. ශාක නිරෝධායන ප්‍රතිපත්ති ක්‍රියාත්මක කරන්නේ ,

1. ගොවිජන සේවා දෙපාර්ථමේන්තුව මගිනි.  2. පසු අස්වනු තාක්ෂණ ආයතනය මගිනි.
3. කෘෂිකර්ම දෙපාර්ථමේන්තුව මගිනි.  4. පැලෑටි ජාන සම්පත් සංරක්ෂණ ආයතනය මගිනි.
5. වනජීවි සංරක්ෂණ දෙපාර්ථමේන්තුව මගිනි.

08. වාෂ්පිකරණ තැටියේ මුල්දින පාඨාංකය 150 mm ක්ද පසු දින පාඨාංකය 156 mm ක්ද වේ. එදින වර්ෂාපතනය 10mm ක් නම්, එදිනට අදාල වාෂ්පීකරණය වන්නේ,

1 0.6mm  2 4mm  3 6mm  4 40mm  5 60mm

- **වියළි හා තෙත් බල්බ උෂ්ණත්ව වෙනසට අනුකූල සාපේක්ෂ ආර්ද්‍රතාව පහත වගුවෙහි දක්වා ඇත 9 හා 10 ප්‍රශ්න වලට පිලිතුරු සැපයීම සඳහා මෙම වගුව භාවිතා කරන්න**

| උෂ්ණත්වය $C^0$ | වියලි හා තෙත් බල්බ උෂ්ණත්වමාන පාඨාංක අතර වෙනස | | | | | |
|---|---|---|---|---|---|---|
| | 0.5 | 1.0 | 1.5 | 2.0 | 2.5 | 3.0 |
| 28 | 96 | 93 | 89 | 85 | 82 | 78 |
| 30 | 96 | 93 | 89 | 86 | 83 | 79 |
| 32 | 96 | 93 | 90 | 86 | 83 | 80 |

09. එක්තරා ස්ථානයක වියළි හා තෙත් බල්බ පාඨංක පිළිවෙළින් 30$C^0$ හා 28$C^0$ විය. මෙම ස්ථානයේ සාපේක්ෂ ආර්ද්‍රතාවය වනුයේ ,

1. 85% ක් වේ.  2. 86% ක් වේ.  3. 93% ක් වේ.  4. 83% ක් වේ.  5. 78% ක් වේ.

10. වාතයේ අවම තෙතමන ප්‍රමාණයක් වර්තා වනුයේ වියළි හා තෙත් බල්බ පාඨාංක පිළිවෙළින්

1. 28$C^0$ ක් හා 31$C^0$ වූ විටය.  2. 31$C^0$ ක් හා 28$C^0$ වූ විටය.
3. 25$C^0$ ක් හා 28$C^0$ වූ විටය.  4. 28$C^0$ ක් හා 25$C^0$ වූ විටය.
5. 28. 5$C^0$ ක් හා 28$C^0$ වූ විටය.

11. කෘෂි පාරිසරික කලාප මායිම් සලකුනු කිරීම පදනම් වි ඇත්තේ

1. උෂ්ණත්වය, වර්ෂාපතනය හා පස් වර්ගය මතය.
2. උෂ්ණත්වය, වර්ෂාපතනය හා බෝග වර්ගය මතය.
3. වර්ෂාපතනය, පස්වර්ගය හා බෝගවර්ගය මතය.
4. පස් වර්ගය, බෝග වර්ගය හා උච්චත්වය මතය.
5. උච්චත්වය, උෂ්ණත්වය හා පස් වර්ගය මතය.

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

12. සමෝච්ඡ රේඛා අනුව බිම් සැකසීම
    1. ජෛව විද්‍යාත්මක පාංශු සංරක්ෂණ ක්‍රමයට අයත්වේ.
    2. යාන්ත්‍රික පාංශු සංරක්ෂණ ක්‍රමයට අයත්වේ.
    3. ශෂ්‍ය විද්‍යාත්මක පාංශු සංරක්ෂණ ක්‍රමයට අයත්වේ.
    4. හෙල්මළු දැමීම අයත්වන පාංශු සංරක්ෂණ ක්‍රමයට අයත්වේ.
    5. ඉහත සඳහන් පාංශු සංරක්ෂණ ක්‍රමයන් තුනටම අයත් නොවේ.

13. යල සහ මහ කන්න ගත්කළ වීවල අස්වැන්න හෙක්ටයාරයකට මෙට්‍රික් ටොන් හා මුළු නිෂ්පාදනය මෙට්‍රික් ටොන් පිළිබඳ සත්‍ය වගන්තිය වනුයේ,
    1. මහ කන්නයේදී මුළු නිෂ්පාදනය වැඩි වුවද, අස්වැන්න වැඩි යල කන්නයේදීය.
    2. මහ කන්නයට සාපේක්ෂව යල කන්නයේදී මුළු නිෂ්පාදනය මෙන්ම අස්වැන්නද වැඩිය.
    3. යල කන්නයට සාපේක්ෂව මහ කන්නයේදී මුළු නිෂ්පාදනය මෙන්ම අස්වැන්නද වැඩිය.
    4. මුළු නිෂ්පාදනය වෙනස් වුවද, කන්න දෙකෙහිම අස්වැන්න එකිනෙකින් වෙනස් නොවේ.
    5. මහ කන්නයේ අස්වැන්න සැමවිටම වැඩිමුත් වැඩිම මුළු නිෂ්පාදනයක් ලැබෙන්නේ යල් කන්නයේදිය.

14. පාංශු වයනය සෙවීමේ පිපෙට්ටු ක්‍රමය පරීක්ෂණයේදී හයිඩ්‍රජන් පෙරොක්සයිඩ් යොදාගනු ලබන්නේ,
    1. කාබනික ද්‍රව්‍ය විනාශ කිරීමටය.
    2. පාංශු අංශුන් වෙන් කිරීමටය.
    3. පසේ ඇති ක්ෂුද්‍ර ජීවීන් විනාශ කිරීමටය.
    4. පසේ ඇති කැල්සියම් ලවන දියවීම සඳහාය.
    5. උෂ්ණත්වය පාලනය කිරීමටය.

15. පාංශු ව්‍යුහයන් ආකාර කිහිපයක රූපසටහන් පහත දක්වා ඇත



A B C D E

A – A ව්‍යුහය මුල මණ්ඩලය අවට පසෙහි දක්නට ලැබෙන කැටිති ව්‍යුහයයි

B – C ව්‍යුහය මැටි සහිත පසෙහි බහුලව දක්නට ලැබෙන ව්‍යුහ ආකාරයි

C - D ව්‍යුහය ජලවහනය දුර්වල ස්ථානවල දක්නට ලැබේ

එම ව්‍යුහයන් සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශ/ ප්‍රකාශයන් සඳහන් කරන්න

1. A පමණි 2. B පමණි 3. C පමණි
4. A හා B පමණි 5. A හා C පමණි

16. පස් නියැදියක අඩංගු කැටායන ප්‍රමාණ පහත වගුවේ දැක්වේ අයන වර්ගය

| | $H^+$ | $K^+$ | $Mg^{2+}$ | $Ca^{2+}$ | $Na^+$ | $Al^{3+}$ |
|---|---|---|---|---|---|---|
| කැටායන මිලිසමක / පස් 100 g | 0.5 | 0.3 | 0.1 | 1.0 | 0.5 | 0.6 |

ඉහත සඳහන් පසේ භෂ්ම සංතෘප්ත ප්‍රතිශතය

1. 11% කි 2. 28% කි 3. 38 % කි 4. 47 % කි 5. 63% කි

17. පස හා සම්බන්ධ ප්‍රකාශ දෙකක් පහත දැක්වේ,

A වැලි ප්‍රතිශතය 40%ක්ද , රොන්මඩ ප්‍රතිශතය 40%ක්ද මැටි ප්‍රතිශතය 20%ක්ද වන පස ලෝම පසයි

B ලෝම පසෙහි බෝග වගාව සඳහා ප්‍රශස්ථ ගුණාංග පවතී

1. A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර A මගින් B වඩාත් පැහැදිළි කරයි.
2. A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර B මගින් A වඩාත් පැහැදිළි කරයි.
3. A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර A මගින් B වඩාත් පැහැදිළි නොකරයි.
4. A හා B ප්‍රකාශ දෙකම සත්‍ය වන අතර B මගින් A වඩාත් පැහැදිළි නොකරයි.
5. A හා B ප්‍රකාශ දෙකම අසත්‍ය ප්‍රකාශ වේ.

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

18. සෞඛ්‍යමත් පසක තිබියයුතු ලක්ෂණයක් වන්නේ,
    1. පසක භෞතික රසායනික හා ජෛවීය ගුණාංග මනා සංකලනයකින් යුක්තවීම.
    2. පසක මුළු පරිමාවෙන් 25% බැගින් පාංශු ජලය හා ඛණිජ ඇතුළත් වියයුතුයි.
    3. සියලු පළිබෝධවලින් තොර කැටායන හුවමාරු ධාරිතාව වැඩි පසක් ලෙස පැවතීම.
    4. භෞතික රසායනික ලක්ෂණ වලින් යුත් ජීව ක්‍රියාවලින් තොර උපරිම නිෂ්පාදන විභවයක් පැවැතිම.
    5. දෘශ්‍ය ඝණත්වය $1.6gcm^{-3}$ ට වඩා වැඩිවීම.

19 තෙත් කලාපීය පසක බහුලව දැකිය හැකි පාංශු ගැටළු වන්නේ
    1. යකඩ විෂවීම හා ඇලුමිනියම් පොස්පරස් හිගවීම.
    2. යකඩ ඇලුමිනියම් හා සෝඩියම් විෂතාවය.
    3. යකඩ මැග්නීසියම් හා පොස්පරස් හිගතාවය.
    4. යකඩ පොස්පරස් හා ඇලුමිනියම් විෂතාවය.
    5. යකඩ ඇලුමිනියම් විෂතාවය හා පොස්පරස් හිගවීම.

20. පාංශු ව්‍යුහ තැනීමේදි බන්ධන කාරක ලෙස ක්‍රියා නොකරන්නේ,
    1. කාබනික ද්‍රව්‍යය 2. යකඩ ඔක්සයිඩය 3. කාබනේටය 4. නයිට්‍රේටය 5. මැටිය

21. පාංශු ඝණත්වය පිළිබඳ පහත සඳහන් ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරදි වන්නේ,
    1. සෑමවිටම පසේ සත්‍ය ඝණත්වය දෘෂ්‍ය ඝණත්වයට වඩා පහල අගයක් ගනි.
    2. සෑමවිටම පසේ සත්‍ය ඝණත්වය දෘෂ්‍ය ඝණත්වයට වඩා ඉහල අගයක් ගනි.
    3. පසේ සත්‍ය ඝණත්වය දෘෂ්‍ය ඝණත්වයට බොහෝදුරට සමානය.
    4. පසේ සත්‍ය ඝණත්වය හා සච්ඡිද්‍රතාවය අතර ඇත්තේ අනුලෝම සම්බන්ධතාවයකි.
    5. පසේ සත්‍ය ඝණත්වය හා සච්ඡිද්‍රතාවය අතර ඇත්තේ ප්‍රතිලෝම සම්බන්ධතාවයකි.

22. පසේ සච්ඡිද්‍රතාව මූලිකව රඳාපවතින්නේ,
    1. දෘශ්‍ය ඝණත්වය හා පසේ ව්‍යුහය මතය. 2. වගා කළ බෝග වර්ගය හා ප්‍රභේදය මතය.
    3. මාතෘද්‍රවය හා පස නිර්මාණයවීමේ ක්‍රියාවලිය මතය. 4. විශිෂ්ඨගුරුත්වය හා පසේ තෙතමන ප්‍රමාණය මතය.
    5. කාබනික ද්‍රව්‍යවල සංයුතිය හා පසේ ගැඹුර මතය.

23. මන්සල් වර්ණ සටහනෙහි වර්ණ කේතයන් සඳහා ප්‍රධාන වශයෙන් පදනම්වී ඇත්තේ,
    1. කොළ, සුදු, රතු හා නිල්ය. 2. රතු ,කහ ,නිල් හා කොළය.
    3. නිල්,කොල ,රතු හා තැඹිලි පාටය. 4. දුඹුරු, රතු, කහ හා නිල්ය.
    5. රතු, කහ, කොළ හා සුදු ය.

24. මැටි ඛනිජ සෑදී ඇති මූල ද්‍රව්‍ය වනුයේ,
    1 කැල්සියම් හා ඇලුමිනියම් ය. 2. සෝඩියම් හා ඔක්සිජන් ය. 3. ඇලුමිනියම් හා සිලිකන් ය.
    4. සිලිකන් හා හයිඩ්‍රජන් ය. 5. සෝඩියම් හා සිලිකන් ය.

25. පාංශු තෙතමන ප්‍රමාණය තීරණය සඳහා කරනලද පරීක්ෂණයකදී පහත දත්ත ලැබුනි
    බඳුනේ බර = 30g බඳුන සහ පස්වල බර = 60g බඳුන සහ වියළි පස් වල බර = 50 g
    පසේ තෙතමන ප්‍රතිශතය වනුයේ,
    1. 0.5% වේ. 2. 5.0% වේ. 3. 50.0 %වේ. 4. 10.0% වේ. 5. 1.0 %වේ.

26. ශාක පෝෂණය පිළිඹඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
    A ශාක පෝෂණය සඳහා වැදගත්වන අත්‍යවශ්‍ය පෝෂක 9ක් හා අත්‍යවශ්‍ය නොවන පෝෂක 6ක් ඇත.
    B අත්‍යවශ්‍ය පෝෂක ශාක පෝෂණයට සෘජුවම දායකවන අතර ඒවා නොමැතිව ශාකයකට ජීවන චක්‍රය සම්පූර්ණ කළ නොහැකිය.
    C ක්ෂුද්‍ර පෝෂක ශාක පෝෂණයට වැදගත්වන නමුත් අත්‍යවශ්‍ය නොවේ.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
    1. A පමණි. 2. B පමණි. 3. C පමණි.
    4. A හා B පමණි. 5. B හා C පමණි.

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

27. පසකට කාබනික පොහොර එකතු කළවිට එහි ඇති පෝෂ්‍ය පදාර්ථ පැළෑටි වලට ලබාගැනීම සඳහා එක්තරා ක්‍රියාවලියකට භාජනය වියයුතුය. මෙම ක්‍රියාවලිය නම් කෙරෙන්නේ,
1. නයිට්‍රීකරණය ලෙසය 2. ඔක්සිකරණය ලෙසය 3. ඛණිජීකරණය ලෙසය
4. පෝෂණීකරණය ලෙසය 5. ඔක්සිහරණය ලෙසය

28. එක්තරා ශාක පෝෂක මූලද්‍රව්‍යයක ඌණතා ලක්ෂණ, බෝගයක පරිණත පත්‍රවල හටගෙන තිබෙනු ශිෂ්‍යයෙකු නිරීක්ෂණය කළේය. මෙම මූලද්‍රව්‍ය වඩාත් හොඳින් වර්ගීකරනය කළ හැක්කේ,
1. මහා මූලද්‍රව්‍යයක් ලෙසය 2. ක්ෂුද්‍ර මූලද්‍රව්‍යයක් ලෙසය 3. උපකාරක මූලද්‍රව්‍යයක් ලෙසය
4. චල මූලද්‍රව්‍යයක් ලෙසය 5. අචල මූලද්‍රව්‍යයක් ලෙසය

29. මොලිබ්ඩිනම් යනු,
1. අත්‍යවශ්‍ය නොවන මූලද්‍රවයයකි. 2. අත්‍යවශ්‍ය මහා මූලද්‍රව්‍යයකි.
3. අත්‍යවශ්‍ය ක්ෂුද්‍ර මූල ද්‍රවයකි. 4. ශාක වලට විෂ සහිත මූල ද්‍රව්‍යයකි.
5. උපකාරක මූලද්‍රවයයකි.

30. ගොවියෙක් තම ක්ෂේත්‍රයෙහි බඩ ඉරිඟු සිටුවා ටික කලකට පසු පරිණත පත්‍ර දම් පැහැති වන බව හඳුනාගන්නා ලදි. මේ සඳහා යෙදිය යුතු රසායනික පොහොර වන්නේ,
1. ඇමෝනියම් සල්පේට් 2. ත්‍රිත්ව සුපර් පොස්පේට්ය 3. මියුරියේට් ඔෆ් පොටෑෂ්ය
4. ඩොලමයිට් ය 5. පොටෑසියම් නයිට්‍රේට්ය

31. ඒකාබද්ධ ශාක පෝෂක කලමනාකරණ සංකල්පයට ගැලපෙන ක්‍රියාකාරකමක් වන්නේ,
1. රසායනික පොහොර යොදා පසුව කාබනික පොහොර යෙදීම.
2. කාබනික පොහොර පමණක් භාවිත කිරීම.
3. රසායනික පොහොර පමණක් භාවිත කිරීම.
4. කාබනික පොහොර හා රසායනික පොහොර මිශ්‍රව යෙදීම.
5. කාබනික පොහොර යොදා බෝගයේ අවශ්‍යතාවය පරිදි රසායනික පොහොර යෙදීම.

32. වාර්ෂික බෝග සඳහා එප්පාවල රොක් පොස්පේට් නිර්දේශ නොකිරීමට ප්‍රධාන හේතුව
1. එහි අවශ්‍ය ප්‍රමාණයට $P_2O_5$ අඩංගු නොවීමයි.
2. එය දේශීය වෙළඳපොළෙහි පහසුවෙන් ලබාගත නොහැකි වීමයි.
3. එය $P_2O_5$ සෙමින් නිදහස් කිරීමයි.
4. එහි අත්‍යවශ්‍ය ක්ෂුද්‍රපෝෂක අඩංගු නොවීමයි.
5. එය වාර්ෂික බෝග වලට විෂ වීමයි.

33. පොහොර බෑගයක් 23-19-17 ලෙස ලේබල් කර ඇත්නම්
1. එහි 23% ක් N ද 19% ක් K ද 17% ක් P ද අඩංගු වේ
2. එහි 23% ක් N ද 19% ක් $P_2O_5$ ද 17% ක් $K_2O$ ද අඩංගු වේ
3. එය ශාකවල N අවශ්‍යතාවයෙන් 23% ක්ද P අවශ්‍යතාවයෙන් 19% ක්ද K අවශ්‍යතාවයෙන් 19% ක් ද සපයයි
4. එය ශාකවල N අවශ්‍යතාවයෙන් 23% ක්ද K අවශ්‍යතාවයෙන් 19% ක්ද P අවශ්‍යතාවයෙන් 19% ක් ද සපයයි
5. එය N කිලෝග්‍රෑම් 23 ක්ද P කිලෝග්‍රෑම් 19 ක්ද $K_2O$ කිලෝග්‍රෑම් 17 ක්ද සපයයි

34. පහත දී ඇත්තේ රසායනික පොහොර වර්ග කිහිපයකි
A යූරියා B ඩයි ඇමෝනියම් පොස්පේට් C සාන්ද්‍ර සුපර් පොස්පේට්
D මියුරියේට් ඔෆ් පොටෑස් E එප්සම් සෝල්ට්
වැලි සහිත ක්ෂේත්‍රයක පිහිටුවා ඇති පැපොල් වගාවක මේරූ පත්‍රවල නාරටි අතර කහ පැහැයට හැරී තිබූ අතර ක්‍රමයෙන් එම තත්වය ළපටි කොළ දෙසට විහිදෙමින් තිබුණි . මෙම තත්වය වලක්වා ගැනීම සඳහා යොදාගතහැකි වඩාත්ම සුදුසු පොහොර වර්ගය/ වර්ග වන්නේ,
1. A හා B පමණි 2. C පමණි 3. D පමණි 4. E පමණි 5. C සහ D පමණි

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

35. බැවුම් සහිත භූමියක බෝග වගාවක් ඇරඹීම සඳහා පැල සිටුවන ස්ථානය පමණක් මදක් පස බුරුල් කර පැල සිටුවන ලදී. එහිදී යොදාගත් බිම් සැකසීමේ ක්‍රමය වන්නේ,
1. සම්මත බිම් සැකසීම
2. අවම බිම් සැකසීම
3. ශුන්‍ය බිම් සැකසීම
4. උපරිම බිම් සැකසීම
5. වසර පුරා බිම් සැකසීම

36. ගොවියෙක් ගොයම් පැල සිටුවීමේදී යන්ත්‍රයක් මගින් පැළ සිටුවීමට අදහස් කරයි නම් ඔහු විසින් යොදාගත යුතු තවාන් වර්ගය වන්නේ,
1. මඩ තවාන
2. තැටි තවාන
3. ඩැපොග් තවාන
4. ස්පොන්ජ් තවාන
5. උස්බිම් තවාන

37. ප්‍රාථමික බිම් සැකසීමේදී සෑමවිටම
1. යටිපස බුරුල්වීම සිදුවේ
2. පාංශු ව්‍යුහය බිඳවැටීම සිදුවේ
3. වැඩි තෙතමන අවස්ථා තෝරාගත යුතුය
4. පස වියළිව පැවැතියයුතුය
5. තදවී ඇති පස බුරුල් කිරීම අරමුණවේ

38. තවානක් ජීවාණුහරණයේදි භාවිතයට නුසුදුසු ක්‍රමයක් වන්නේ,
1. දිලිර නාශකයක් යෙදීම
2. අධික සූර්යතාපයට භාජනය කිරීම
3. ධූමකරණය කිරීම
4. නටන උණුවතුර යෙදීම
5. පිළිස්සීමෙන් අනතුරුව කොම්පෝස්ට් එකතු කිරීම

39. පහත ප්‍රකාශ අතුරින් වඩාත් නිවැරැදි ප්‍රකාශය වන්නේ
1 අවම බිම් සැකසීම මගින් පස තදවීම වැඩිවේ
2 සම්ප්‍රධායිකව බිම් සැකසූ පසකට වඩා වේගයෙන් ශුන්‍ය බිම් සැකසූ පසක් වියළේ
3 අවම බිම් සැකසීම හා ශුන්‍ය බිම් සැකසීම අතර වෙනසක් නොමැත
4 අවම බිම් සැකසීමට යන වියදම අඩු බැවින් ආන්තික ඉඩම් වගාකිරීමට ඉඩ ලැබේ
5 අවම බිම් සැකසීමට සාපේක්ෂව සම්ප්‍රදායික බිම් සැකස්ම සඳහා උපකරණ අවශ්‍යතාවය අඩුය

40. බෝග සංස්ථාපනය පිළිඹඳ ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.
A - බීජ සිටුවීමේදි එකම ගැඹුරක් පවත්වා ගැනීමෙන් ඒකාකාරව පරිණතවූ බෝගයක් ලබාගැනීමට මගපැදේ
B - ඍජුව ක්ෂේත්‍රයේ බීජ වැපිරීමේ වාසියක් වනුයේ අඩු බීජ ප්‍රමාණයක් අවශ්‍යවීමය
C - පේළි ලෙස සිටුවීමෙන් වල් පැල පාලනයට යන ශ්‍රම අවශ්‍යතාවය අඩුකළ හැකිය.
ඉහත ප්‍රකාශ අතුරෙන් නිවැරදි වනුයේ,
1. A පමණි.
2. B පමණි.
3. C පමණි.
4. A හා C පමණි.
5. B හා C පමණි.

41. රූපසටහනේ දක්වා ඇති කෘෂි උපකරණය



1. මොල් බෝර්ඩ් නගුල
2. දේශීය නගුල
3. ජපන් රොටරි විඩරය
4. තැටි පෝරුව
5. යටි පස බුරුල් කරන නගුල

42. එම බිම් සැකසීමේ උපකරණය භාවිතා කිරීමේ ප්‍රධාන පරමාර්ථ වන්නේ,
A පස පෙරළීම
B හොඳ බිජ පාත්ති සැකසීම
C පස් කැට පොඩි කිරීම
D තදවූ පස විවෘත කිරීම
1. A හා B පමණි
2. A හා C පමණි
3. A හා D පමණි
4. B හා C පමණි
5. B හා D පමණි

SLGURU.LK

For Educational Purpose Only

SLGURU.LK

43. කේන්ද්‍රාපසාරී පොම්ප සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය වන්නේ,
   1 එමගින් ඕනෑම ගැඹුරක ඇති ජලය පහසුවෙන් එසවිය හැකි ය.
   2 මෙය ඉම්පෙලරයකින් හා භ්‍රමණ කුටීරයකින් සමන්විත වේ.
   3 මෙමගින් වඩා ගැඹුරේ ඇති ජලය එසවීමට ගැඹුරු ලිං කට්ටල භාවිත කළ යුතු ය.
   4 මෙය තැනින් තැනට ගෙන යාමට හැකියාව ඇත.
   5 ඉදිකිරීම් බිම්වල පවතින මඩ සහිත ජලය ඉවත් කිරීමට යොදා ගත හැකි ය.

44. ජල සම්පාදනය කිරීමේදි ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාව තීරණය කරන සාධක වන්නේ ,
   1. පාංශු තෙතමන ප්‍රතිශතය , ක්ෂේත්‍රධාරිතාවය හා දෘශ්‍ය ඝණත්වය
   2. පාංශු තෙතමන ප්‍රතිශතය , ක්ෂේත්‍රධාරිතාවය හා පාංශු වයනය
   3. පාංශු තෙතමන ප්‍රතිශතය , ක්ෂේත්‍රධාරිතාවය හා සච්ඡිද්‍රතාව
   4. පසේ වයනය, පාංශු ව්‍යුහය හා දෘශ්‍ය ඝණත්වය
   5. පසේ වයනය, පාංශු ව්‍යුහය හා සච්ඡිද්‍රතාව

45. වියළි කලාපයේ ඉඩමක බහුවාර්ෂික පළතුරු බෝගයක් වගා කිරීමේදී වඩාත් යෝග්‍ය වන ජල සම්පාදන ක්‍රමය වන්නේ,
   1. බිංදු ජලසම්පාදනයයි. 2. පිටාර ජලසම්පාදනයයි. 3. ඇළි හා වැටි ක්‍රමයයි.
   4. විසිරුම් ජල සම්පාදනයයි. 5. තීරු ජලසම්පාදනයයි.

46. ඇළි හා වැටි ජලසම්පාදන ක්‍රමය අනෙකුත් මතුපිට ජල සම්පාදන ක්‍රම වලට වඩා වාසිදායක වීමට ප්‍රධාන හේතුව වන්නේ,
   1. අතුරුයත්ගැමේ කටයුතු පහසු බැවිනි.
   2. වාෂ්පීකරණයෙන් වන ජල හානිය අඩු බැවිනි.
   3. කම්කරු අවශ්‍යතාවය ඉතාමත් අඩු බැවිනි.
   4. සමතලා නොවූ භූමියකට වුවද ඒකාකාරීව ජලය සැපයියහැකි බැවිනි.
   5. ශාක මුල පමණක් ජලයෙන් යට කිරීම නිසා ජල කාර්යක්ෂමතාවය අඩු බැවිනි.

47. බෝග වගා ක්ෂේත්‍රවලට ජල සම්පාදනය සඳහා යොදාගන්නා පහත රූප සටහනෙහි දැක්වෙන ජල පොම්පය සම්බන්ධයෙන් ප්‍රකාශ කිහිපයක් පහත දැක්වේ.




   A ක්‍රියාකරවීමේදී පාකපාට යෙදීම අවශ්‍ය වේ
   B ජලය පොම්ප කිරීමේදි සාමාන්‍යයෙන් චූෂණ හිස මීටර් 6කට සීමාවේ
   C මඩ අවක්ෂේප සහිත ජලය වුවද පොම්ප කළ හැක
   ඉහත ප්‍රකාශවලින් සත්‍ය වන්නේ,
   1. A පමණි 2. B පමණි 3. B හා C පමණි
   4. A හා C පමණි 5. A B හා C යන සියල්ලම වේ

48. හෙක්ටයාර් එකක බඩඉරිඟු වගාවක් සඳහා ශුද්ධ ජල සම්පාදන අවශ්‍යතාව 12.5 cm වේ. මෙම භූමියට යෙදිය යුතු ජල පරිමාව වන්නේ,
   1. $1250cm^3$ 2. $1550\ cm^3$ 3. $1750cm^3$ 4. $2000\ cm^3$ 5. $12500cm^3$

49. ජලසම්පාදන කාර්යක්ෂමතාවය 25% වූවිට ඉහත වගාව සඳහා දල ජලසම්පාදන අවශ්‍යතාවය වනුයේ,
   1. 14.5 cm 2. 15.5 cm 3. 25.5 cm 4. 35 cm 5. 50 cm

50. පහත රූපසටහන උපයෝගී කරගනිමින් පිළිතුරු සපයන්න



   1. ජලය 60cm -90cm උසකට එසවීම සඳහා යොදාගත හැකිය
   2. විශාල වාරිමාර්ග වලින් ජලය ක්ෂේත්‍රයට ලබාගැනීම සඳහා යෝග්‍යවේ
   3. මෙය සෑදීම සඳහා ලෝහ පටියක් යොදාගනී
   4. විශාල වගා ක්ෂේත්‍රවලට ජලය සැපයීමට යෝග්‍ය වේ
   5. ශ්‍රී ලංකාවේ වියළි කලාපයේ වගා ක්ෂේත්‍රයන්ට ජලය සැපයීම සඳහා බහුලව යොදාගන්නා ක්‍රමයකි

SLGURU.LK



For Educational Purpose Only

“A book is a gift you can open again and again.” — Garrison Keillor

Visit SLGURU.LK to download papers and notes.

SLGURU.LK

සියලු හිමිකම් ඇවිරිණි / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

Provincial Department of Education - NWP

08 S II

දෙවන වාර පරීක්ෂණය - 12 ශ්‍රේණිය - 2020

Second Term Test - Grade 12 - 2020

විභාග අංකය .............................

කෘෂි විද්‍යාව II

කාලය පැය තුනයි

උපදෙස්

- A කොටසේ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න. ඒ සඳහා එම ප්‍රශ්න සමග වෙන්කර ඇති ඉඩ යොදන්න.
- B කොටසේ ප්‍රශ්න හතරකට පමණක් පිළිතුරු සපයන්න.

## A කොටස (ව්‍යුහගත රචනා)

01.A) i) කෘෂිකර්මාන්තය යන්න හඳුන්වන්න

.................................................................................................................................

.................................................................................................................................

.................................................................................................................................

ii) කෘෂිවිද්‍යාව ශුද්ධ හා ව්‍යවහාරික විද්‍යාවල එකතුවක් බව පැහැදිලිවන සාක්ෂි දෙකක් සඳහන් කරන්න.

1. .................................................................................................................................
2. .................................................................................................................................

iii) අතීත ශ්‍රි ලංකාවේ කෘෂිකාර්මික සශ්‍රීකත්වයට දේශීය තාක්ෂණය ඉවහල්වූ ආකාරය පිළිබිඹුවන සාක්ෂි සඳහන් කරන්න.

1. .................................................................................................................................
2. .................................................................................................................................
3. .................................................................................................................................
4. .................................................................................................................................

B) කෘෂිකර්මාන්තය ආශ්‍රිතව විවිධ කර්මාන්ත හා සේවා රැසක් ක්‍රියාත්මක වේ .

i) කෘෂිකර්මාන්තය ආශ්‍රිතව ක්‍රියාත්මක වන කර්මාන්ත හා සේවාවන් 3ක් බැගින් සඳහන් කරන්න

| කෘෂිකර්මය ආශ්‍රිත කර්මාන්ත | කෘෂිකර්මය ආශ්‍රිත සේවාවන් |
|---|---|
| 1 | 1 |
| 2 | 2 |
| 3 | 3 |

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

C) ශ්‍රී ලංකාවේ ඇති වාර්ෂික බෝග පිළිබඳ පර්යේෂණ ආයතන 3ක් ඒවා පිහිටි ස්ථාන සමග සඳහන් කරන්න.

| පර්යේෂණ ආයතනයේ නම | පිහිටි ස්ථානය |
|---|---|
| | |
| | |
| | |

ii) පර්යේෂණ ආයතන මගින් සිදුවන සේවාවන් දෙකක් සඳහන් කරන්න.

1. ..................................................

2. ..................................................

iii) ශ්‍රී ලංකාවේ වගා කරන වැවිලි නොවන ප්‍රධාන අපනයන බෝග 3 ක් ලැයිස්තුගත කරන්න

1. ..................................................

2. ..................................................

3. ..................................................

iv) ශ්‍රී ලංකාවේ වැවිලි නොවන අපනයන කෘෂිකර්ම බෝග ක්ෂේත්‍රයට සුවිශේෂිවූ ප්‍රධාන ගැටළු හතරක් ලැයිස්තුගත කරන්න.

1. ..................................................

2. ..................................................

3. ..................................................

4. ..................................................

D) බිම් සැකසීම සඳහා යොදාගනු ලබන උපකරණයක රූප සටහනක් පහත දක්වා ඇත.




i) බිම් සැකසීමේ උපකරණය නම් කරන්න.

..................................................

ii) එම උපකරණය යොදාගනු ලබන බිම් සැකසීමේ පියවර කුමක්ද?

..................................................

iii) එහි A හා B ලෙස දක්වා ඇති කොටස් නම් කරන්න.

A ..................................................

B ..................................................

iv) එම උපකරණය භාවිතයෙන් බිම් සැකසීමෙන් පසු පසේ දක්නට ලැබෙන වෙනස්කම් මොනවාද?

1. ..................................................

2. ..................................................

3. ..................................................

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

02. A) වර්ෂාමානයක් භාවිතාකර ලබාගත් මාසික වර්ෂාපතන අගයන් පහත වගුවේ දක්වා ඇත.

| මාසය | ජන | පෙබ | මාර් | අප්‍රේ | මැයි | ජූනි | ජූලි | අගෝ | සැප් | ඔක් | නොව | දෙසැ |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වර්ෂාපතනය mm | 80 | 20 | 80 | 140 | 130 | 40 | 25 | 20 | 80 | 160 | 180 | 120 |

i) එම ප්‍රදේශයේ වාර්ෂික වර්ෂාපතනය ගණනය කරන්න

.............................................................................................................................

.............................................................................................................................

ii) එම වර්ෂාපතන රටාව පෙන්නුම් කළහැකි කෘෂි දේශගුණික කලාපය සඳහන් කරන්න.

.............................................................................................................................

iii) එම කෘෂිදේහගුණික කලාපයට අයත් එක්තරා නගරයක දෙසැම්බර් මාසයේදී විෂ්කම්භය සෙන්ටිමීටර් 14ක් වූ වර්ෂාමානයකට ලැබුනු ජල පරිමාව 308 $cm^3$ විය. එදින එම ප්‍රදේශයට ලැබුනු වර්ෂාපතනය උසක් ලෙස දක්වන්න. (ල.04)

.............................................................................................................................

.............................................................................................................................

.............................................................................................................................

iv) ප්‍රධාන පස් කාණ්ඩය සඳහන් කරන්න.

.............................................................................................................................

v) එම පසෙහි බෝග වගා කිරීමේදී ඇතිවියහැකි ගැටලු සහගත තත්වයන් තුනක් සඳහන් කරන්න

1. .............................................................................................................................

2. .............................................................................................................................

3. .............................................................................................................................

B) එකිනෙතට වෙනස් පස් නියැදි හතරක් පරීක්ෂා කිරීමෙන් ලද ප්‍රතිඵල පහත දැක්වේ.

| | A පස | B පස | C පස | D පස |
|---|---|---|---|---|
| දෘශ්‍ය ඝනත්වය ( $g/cm^3$ ) | 1. 6 | 1. 5 | 1.7 | 1.2 |
| ක්ෂේත්‍ර ධාරිතාවේ ජලය ප්‍රමාණය ( % ) | 13 | 25 | 10 | 28 |
| කාබනික ද්‍රව්‍ය ( % ) | 1.7 | 2.0 | 1.5 | 3.5 |
| කැටායන හුවමාරු ධාරිතාව ( meq/ 100g ) | 15- 20 | 20 - 25 | 10 - 15 | 50 -100 |

i) බෝග වගාවට වඩාත් සුදුසු පස සඳහන් කරන්න

.............................................................................................................................

ii) D පසෙහි කැටායන හුවමාරුව වැඩිවීමට ප්‍රධාන හේතුව කුමක්ද?

.............................................................................................................................

iii) බෝග වගාව සඳහා දෘෂ්‍ය ඝනත්වයේ ඇති වැදගක්කම් තුනක් සඳහන් කරන්න.

1. .............................................................................................................................

2. .............................................................................................................................

3. .............................................................................................................................

SLGURU.LK
For Educational Purpose Only

SLGURU.LK

iv) පසක කැටායන හුවමාරු ධාරිතාවේ වාසි දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

v) පංශු pH අගයේ කෘෂිකාර්මික වැදගත්කම් දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

vi) මෙම පස් වර්ග අතරින් බෝග වගාවට වඩාත් නුසුදුසු පස කුමක්ද?

..........

vii) ඔබගේ පිළිතුරට හේතු දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

viii) C පසෙහි ක්ෂේත්‍ර ධාරිතාවයෙහි ජල ප්‍රමාණය අඩු කුමක් නිසාද?

..........

C) i) පාංශු සෞඛ්‍යය යනු කුමක්ද?

..........

..........

..........

ii) යම් පසක් සෞඛ්‍යමත් පසක් වීමට තිබිය යුතු අවශ්‍යතා මොනවාද? (ල.02 x 2 = 4)

1. ..........

2. ..........

3. ..........

D) i) ලවණ පස යනු කුමක්ද?

..........

..........

..........

ii) ලවණ පසෙහි බෝග වගා කිරිමේදී මුහුණ පෑමට සිදුවන ප්‍රධාන ගැටළු දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

iii) ලවණ පසක් පුනරුත්තාපනය සඳහා ගතහැකි ක්‍රියාමාර්ග දෙකක් සඳහන් කරන්න.

1. ..........

2. ..........

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

03) A) ප්‍රධාන වශයෙන් කෘෂි පාරිසරික කලාපවල විවිධත්වය හේතු කොටගෙන ශ්‍රී ලංකාව තුල ඉහල ජෛව විවිධත්වයක් ඇත.

i) ශ්‍රී ලංකාවේ ප්‍රධාන දේශගුණික කලාප තුන ලැයිස්තුගත කරන්න . එම එක් එක් කලාපවලට අයත් කෘෂි පාරිසරික කලාප සංඛ්‍යාවන් සඳහන් කරන්න.

| දේශගුණික කලාපය | කෘෂි පාරිසරික කලාප සංඛ්‍යාව |
|---|---|
| | |
| | |
| | |

ii) පහත සඳහන් කෘෂි පාරිසරික කලාප වල සංකේතය සඳහන් කරන්න.

a. වැඩිම වර්ෂාපතනයක් ලැබෙන පහතරට තෙත් කලාපයට අයත් කෘෂි පාරිසරික කලාපය

..........................................................................................................................................

b. වියළි කලාපයට අයත් විශාලත්වයෙන් වැඩිම කෘෂි පාරිසරික කලාපය

..........................................................................................................................................

c) මැදරට අතරමැදි කලාපයට අයත් මිලිමීටර් 3200 ක වාර්ෂික වර්ෂාපතනයක් ලැබෙන කෘෂි පාරිසරික කලාපය

..........................................................................................................................................

iii) ශ්‍රී ලංකාවේ ප්‍රධාන වගා කන්න දෙක හා එම එක් එක් කන්න වලට වර්ෂාපතනය ලැබෙන යාන්ත්‍රණ සඳහන් කරන්න.

**වගා කන්නය** **වර්ෂාපතනය ලැබෙන යාන්ත්‍රණ**

1. ..........................................................................................................................................

2. ..........................................................................................................................................

B) කෘෂිකර්මයේදී බෝගවලට පෝෂක සැපයීම සඳහා අකාබනික පොහොර වර්ග භාවිතා කරනු ලබයි.

i) පහත සඳහන් ශාක පෝෂකයන් ලබාදීම සඳහා භාවිතා කරනු ලබන රසායනික පොහොර දෙක බැගින් සඳහන් කරන්න.

| පෝෂකය | පොහොර වර්ග |
|---|---|
| නයිට්‍රජන් | |
| පොස්පරස් | |
| පොටෑසියම් | |

ii) පෝෂක හිගවීමත් සමග ශාක පෝෂක ඌණතා ලක්ෂණ පෙන්නුම් කරයි. පහත සඳහන් ශාක පෝෂක ඌණ වීමත් සමග ශාක පෙන්නුම් කරන ඌණතා ලක්ෂණ දෙක බැගින් සඳහන් කරන්න.

| පෝෂකය | ඌණතා ලක්ෂණය |
|---|---|
| නයිට්‍රජන් | 1 |
| | 2 |
| පොස්පරස් | 1 |
| | 2 |
| පොටෑසියම් | 1 |
| | 2 |

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

iii) කෘෂිකර්මාන්තයේදී ඍජු අකාබනික පොහොර භාවිතයේ වාසි දෙකක් හා අවාසි දෙකක් සඳහන් කරන්න.

වාසි

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

අවාසි

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

iv) අක්‍රමවත් පොහොර භාවිතයේ ප්‍රධාන ගැටළු 4 ක් සඳහන් කරන්න.

1. ..................................................................................................................................

2. ..................................................................................................................................

3. ..................................................................................................................................

4. ..................................................................................................................................

v) ඵලදායි ලෙස පොහොර භාවිතයේ 4R සංකල්පය සඳහන් කරන්න.

..................................................................................................................................

..................................................................................................................................

..................................................................................................................................

4) A) කෘෂිකාර්මික කාලගුණ විද්‍යාව පිළිබඳ ප්‍රකාශ කිහිපයක් පහත දක්වා ඇත. මෙම ප්‍රකාශ සත්‍ය / අසත්‍ය දැයි සඳහන් කරන්න.

| | ප්‍රකාශය | සත්‍ය/ අසත්‍ය |
|---|---|---|
| i | වර්ෂාපතනය මැන දක්වනු ලබන්නේ ඉකුත් පැය 24 ක කාලයක් සඳහාය | |
| ii | සුළගේ වේගය මැනීම සඳහා රොබින්සන්ගේ කෝප්ප අනිලමානය යොදාගැනේ | |
| iii | තීව්‍රතාවය, ගුණාත්මය , කාලය , දිශාව යන සතර ආකාරයකින් ආලෝකය ශාක වලට බලපායි | |
| iv | කාලගුණ මධ්‍යස්ථානයකදී උෂ්ණත්වය උදය හා හවස ලෙස මනිනු ලැබේ. | |
| v | වලාකුළු සහිත කාලගුණය, බෝගවල රෝග හා පළිබෝධ හානි වැඩි කරයි. | |
| vi | අධික සාපේක්ෂ ආර්ද්‍රතා තත්ව යටතේදී ශාකවලට දිලීර ආසාදන වැඩිවීම සිදුවේ | |
| vii | තෙත් හා සිසිල් පාංශු පරිසර තත්ව යටතේදී දඬු කැබැලි මුල් ඇදීම සාර්ථකව සිදුවේ | |

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

B i) බෝග වර්ධනය සඳහා සුදුසු පාංශු පරිසරයක් ඇති කිරීමට බිම් සැකසීම උපකාරී වේ. බිම් සැකසීමේ ප්‍රධාන ආකාර ලැයිස්තුගත කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

3. ..............................................................................................................................................

4. ..............................................................................................................................................

ii) පහතරට තෙත් කලාපයේ පිහිටි භූමියක මිරිස් වගාවක් කිරීමට අදහස් කරන්නේ නම් පළමුව බීජ තවානක සිටුවා පසුව ක්ෂේත්‍රයේ නැවත සිටුවන ලෙස ගොවියාට උපදෙස් ලැබුනි.

a. බීජ පළමුව තවානක සිටුවීමට ඔහුට උපදෙස් දීමට හේතුව කුමක්ද?

..............................................................................................................................................

..............................................................................................................................................

b. ඔහුට වඩාත් සුදුසු තවාන් ආකාරය කුමක්ද?

..............................................................................................................................................

C පැරැණි ශ්‍රී ලාංකිකයන්ට ජල සම්පත් කළමණාකරනය පිළිබඳ හොඳ දැනුමක් තිබූ අතර භූගත ජලය පුනරාරෝපණය වැඩි කිරීමට විවිධ ක්‍රම භාවිතා කළහ.

i) භූගත ජලය පුනරාරෝපනය වැඩි කිරීමට පැරැණි ශ්‍රී ලාංකිකයන් භාවිතා කල ක්‍රම දෙකක් ලැයිස්තුගත කරන්න.

1. ..............................................................................................................................................

2. ..............................................................................................................................................

ii) භූගත ජලය පුනරාරෝපණයේ වැදගත්කමක් සඳහන් කරන්න.

..............................................................................................................................................

..............................................................................................................................................

D බෝග සංස්ථාපනය කරනු ලබන ආකාරය අනුව විවිධ බෝග සඳහා විවිධ ආකාරයේ තවාන් යොදාගැනේ. පහත සඳහන් එක් එක් තවානට ගැලපෙන බෝගය බැගින් නම් කරන්න.

a නොරිඩෝකෝ තවාන ..................................................

b ස්පොන්ජ් තවාන ..................................................

c වැලි තවාන ..................................................

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

E) ගොවියකු වියළි කාලයේදි ඔහුගේ පහත් බිමෙහි මාළු මිරිස් වගාකරන ලදී. බෝගය පුෂ්පීකරනය සිදු වන අවධියේදී අසාමාන්‍ය ලෙස තදවැසි ඇතිවිය. වැස්සෙන් දින කිහිපයකට පසු මාළු මිරිස් ශාකවල පත්‍ර කහපැහැවී ඇතිබව ගොවියා නිරීක්ෂණය කළ අතර ක්ෂේත්‍රයේ හයිඩ්‍රජන් සල්පයිඩ් ගඳ වහනය වන බව දැනුණි.

i) මෙම තත්වයට හේතුව කුමක්ද?

.......................................................................................................................................................

ii) මෙම තත්වය නිසා ඇතිවිය හැකි අහිතකර බලපෑම් 4ක් සඳහන් කරන්න.

1. .......................................................................................................................................................

2. .......................................................................................................................................................

3. .......................................................................................................................................................

4. .......................................................................................................................................................

iii) මෙම තත්වය නිවැරදි කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග මොනවාද?

1. .......................................................................................................................................................

2. .......................................................................................................................................................

3. .......................................................................................................................................................

4. .......................................................................................................................................................

iv) මෙම තත්වයට ඔරොත්තුදෙන බෝග දෙකක් සඳහන් කරන්න

1. .......................................................................................................................................................

2. .......................................................................................................................................................

SLGURU.LK



For Educational Purpose Only

SLGURU.LK

# කෘෂි විද්‍යාව 12 - 2020 (දෙවන වාර පරීක්ෂණය)

## B කොටස (රචනා)

- **ප්‍රශ්න 4 ට පමණක් පිළිතුරු සපයන්න (අවශ්‍ය ස්ථානයන්හිදී රූප සටහන් භාවිතා කරන්න.)**

01. i) පාංශු ජනනයට බලපාන සාධක විස්තර කරන්න.
ii) බිම් සැකසීම සමග පසෙහි සිදුවන වෙනස්වීම් පැහැදිලි කරන්න
iii) මතුපිට ජල සම්පාදන ක්‍රම කෙටියෙන් විස්තර කරන්න.

02. i) අවම බිම් සැකසීමේ වැදගත්කම පැහැදිලි කරන්න.
ii) බෝග නිෂ්පාදනය කෙරෙහි පාංශු ව්‍යුහය වැදගත්වන ආකාරය පැහැදිලි කරන්න.
iii) කෘෂිකර්මයේදී භාවිතාවන ජෛව පොහොර කාණ්ඩයන් වර්ගිකරණයකර උදාහරන දෙන්න.

03. i) විසිරි ජල සම්පාදන පද්ධති වියළි කලාපයේ වගා ක්ෂේත්‍ර සඳහා යොදාගැනීමේදී ඇති වාසි අවාසි සඳහන් කරන්න.
ii) කෘෂිකර්මයට විවිධ සේවා සපයන රාජ්‍ය ආයතන 5 ක් ලැයිස්තුගතකර එයින් එකක කාර්යභාරය හා වගකීම පැහැදිලි කරන්න.
iii) පසේ සාරවත් භාවය වැඩි දියුණු කිරීමෙහිලා පාංශු ක්ෂුද්‍ර ජීවීන්ගේ කාර්යභාරය පැහැදිලි කරන්න.

04. i) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක කර ඇති ආර්ථික සංවර්ධන වැඩසටහන් මගින් ජාතික ආර්ථික සංවර්ධනයට ලබාදී ඇති දායකත්වය විස්තර කරන්න.
ii) වගා භූමිවල යොදාගන්නා පාංශු සංරක්ෂණ ක්‍රම විස්තර කරන්න.
iii) කාෂිකාර්මික භූමිවල යොදාගන්නා විවිධ ජලවහන ක්‍රම විස්තර කරන්න.

05. i) ශ්‍රී ලංකාවේ නිදහසින් පසු හඳුන්වාදුන් කෘෂිකර්මය හා සම්බන්ධ පනත් හා නියෝග විස්තර කරන්න.
ii) පොහොර භාවිත කාර්යක්ෂමතාවය වැඩි කිරීමට ගතහැකි ක්‍රියාමාර්ග විස්කර කරන්න.
iii) කෘෂිකර්මයේදි භාවිතාවන විශේෂ තවාන් කෙටියෙන් විස්තරකර ඒවායේ ප්‍රායෝගික භාවිතයන් සඳහන් කරන්න

06. i) ශ්‍රී ලංකාවේ කෘෂිපාරිසරික කලාප හඳුනාගැනීමේ වැදගත්කම් පැහැදිලි කරන්න.
ii) ප්‍රභාසංස්ලේසණයේ කාර්යක්ෂමතාවය වැඩි කරගැනීමට ගතහැකි ක්‍රියාමාර්ග විස්තර කරන්න
iii) බෝග සංස්ථාපනය කිරීමේ විවිධ ක්‍රම සඳහන් කරන්න. වී වගාවේ දී වැඩිම අස්වැන්නක් ලබා ගැනීමට යෝග්‍ය සංස්ථාපන ක්‍රමය නම් කර එහි වැදගත්කම් විස්තර කරන්න.

SLGURU.LK



For Educational Purpose Only

“A book is a gift you can open again and again.” — Garrison Keillor

Visit SLGURU.LK to download papers and notes.